# ඕක්ලන්ඩ් මෙට්‍රෝ කලාපයේ ජීවත්වන සරණාගතයින්ව සිටි පුද්ගලයින් හා වර්තමානයේ සරණාගතභාවය පතන පුද්ගලයින් වෙත 2024 සැප්තැම්බර් මාසයේ 30වන දින දක්වා වෛද්‍ය සේවාවන් ලබාගැනීමේ හැකියාව ලබාදීම

## මේ කුමක්ද?

ඔබ සුදුසුකම් සපුරන ලද සරණාගතයෙකුව සිටි පුද්ගලයෙකු හෝ වර්තමානයේ සරණාගතභාවය පතන පුද්ගලයෙකු නම්, ඔබට හා ඔබේම පවුලේ සාමාජිකයින්ට එවෙලේම නොමිලේ උපදෙස් ලබාගැනීමක් සඳහා හෝ සුළු ගාස්තුවක් ගෙවීමෙන් ඉදිරි කාලයේදී උපදෙස් ලබාගැනීමක් සඳහා [http://www.yourlocaldoctor.co.nz/former-refugee-and-asylum-seeker-health-services/](http://www.yourlocaldoctor.co.nz/former-refugee-and-asylum-seeker-health-services/) හි දක්වා ඇති සහභාගීත්ව මධ්‍යස්ථානවලින් එකකදී පවුලේ වෛද්‍යවරයෙකු/සාමාන්‍ය වෛද්‍යවරයෙකු (GP) සහ/හෝ සේවයේ නියුතු හෙදියක් හමුවිය හැකි ය.

## කා සඳහා ද?

ඔබ එම ලැයිස්තුවේ ඇතුලත් එක් සහභාගීත්ව මධ්‍යස්ථානයක් සමඟ සම්බන්ධ වී සිටින්නේ නම් හා පහත සඳහන් එක් ආකාරයක් මඟින් ඔබ නවසීලන්තයේ නැවත පදිංචි කර සිටින හෝ දැනට ජීවත් වන්නේ නම්, ඔබට මෙම සේවාව ලබාගත හැකි වේ:

- සරණාගත කෝටා වැඩසටහන
- පවුල් සමඟ නැවත එක්වනු ලබන සරණාගතයින් (පවුල් සමඟ නැවත එක්වීමේ සරණාගත කෝටා ගණය හා සරණාගත පවුල් සඳහා සහාය ලබාදීමේ ගණය)
- සම්මුතියට යටත් සරණාගතයින් හෝ ආරක්ෂිත පුද්ගලයින්
- සරණාගතභාවය සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයින්

ඔබ නවසීලන්තයට පැමිණි දිනයේ සිට වසර 10ක් දක්වා මෙම සේවාවන් ලබාගත හැකි ය.

තවමත් තීරණයක් ගෙන නොමැති, නවසීලන්ත ආගමන දෙපාර්තමේන්තුවේ සරණාගතභාවය පිළිබඳ කටයුතු කරන අංශයෙහි සරණාගත හෝ ආරක්ෂිත තත්ත්වය පිළිබඳ ඉල්ලීමක් හෝ අධිකරණ අමාත්‍යාංශයේ ආගමන හා ආරක්ෂාව පිළිබඳ විනිශ්චය අධිකාරයෙහි අභියාචනයක් පවතින්නේ නම්, සරණාගතභාවය සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයින් හට මෙම සේවාව ලබාගත හැකි ය.

## සුදුසුකම් සහිත බව සනාථ කිරීම

ඔබ විසින් පිළිගැනීමේ නිලධාරියා වෙත පහත සඳහන් ලියවිලි පෙන්විය යුතුය:

- ඉතා මෑතකදී නවසීලන්ත ආගමන දෙපාර්තමේන්තුව වෙතින් ඔබේ සරණාගතභාවය තහවුරු කරමින් ලබාගන්නා ලද ලිපියේ හෝ ඔබේ ඉල්ලීමේ හෝ අභියාචන ලිපියේ පිටපතක්.
- ඔබේ ගමන් බලපත්‍රය (හෝ අනන්‍යතා සහතිකය).

## කුමක් සඳහා ද?

මෙම සේවාවේ අරමුණ වනුයේ, අවශ්‍ය අවස්ථාවකදී පවුලේ වෛද්‍යවරයෙකු (GP) හෝ සේවයේ නියුතු හෙදියක් මුණගැසීමට ඔබට හා ඔබේම පවුලේ සාමාජිකයෙකු වෙත උපකාර කිරීමයි. ඔබට පහත සඳහන් සේවාවන් තුන ලබාගත හැකි ය:

- විනාඩි 90ක උපදෙස් ලබාගැනීම - වසරකට එක් රෝගියෙකු වෙත එක් මුණගැසීමක් (දිස්ත්‍රික් සෞඛ්‍ය මණ්ඩල මඟින් විනාඩි 75ක් සඳහා අරමුදල් සපයනු ලබන අතර, ඉතිරි විනාඩි 15 සඳහා කොටසක් ගෙවීම සිදු කළ හෝ නොකළ හැකි ය).
- ඉදිරි කාලයේදී උපදෙස් ලබාගැනීම - විනාඩි 30 (දිස්ත්‍රික් සෞඛ්‍ය මණ්ඩල මඟින් විනාඩි 15ක් සඳහා අරමුදල් සපයනු ලබන අතර, ඉතිරි විනාඩි 15 සඳහා කොටසක් ගෙවීම සිදු කළ හෝ නොකළ හැකි ය).
- නම්‍යශීලී උපදෙස් ලබාගැනීම - දිස්ත්‍රික් සෞඛ්‍ය මණ්ඩල මඟින් අරමුදල් සපයනු ලබන කලින් කලට සපයන සුව සේවාවන් (කොටස් ගෙවීම් නොමැති). මෙමඟින් එන්නත්කරණය/වෛද්‍ය පරීක්ෂණ/ඇගයීම්/රෝග විනිශ්චය කිරීම/ප්‍රතිකාර කිරීම/පුනරුත්ථාපනය කිරීම/වෛද්‍ය නිර්දේශ ලබාදීම/කුටුම්භ සහාය යනාදිය ආවරණය කළ හැකි ය.

## මා හට වෛද්‍ය සේවා මධ්‍යස්ථාන සොයාගත හැක්කේ කවර ස්ථානයන්හිදී ද?

ඕක්ලන්ඩ් මෙට්‍රෝ කලාපය තුළ ඔබට සමීපව පිහිටි, සහභාගීත්ව වෛද්‍ය සේවා මධ්‍යස්ථාන ලැයිස්තුවක් ලබාගැනීම සඳහා http://www.yourlocaldoctor.co.nz/former-refugee-and-asylum-seeker-health-services/ සබැඳිය ක්ලික් කරන්න. මෙම ලැයිස්තුව නිරන්තරයෙන් යාවත්කාලීන කෙරේ.

### භාෂා සහාය

ඔබට භාෂා සහාය අවශ්‍ය නම්, ඔබ ඔබගේ පවුලේ වෛද්‍යවරයා/සාමාන්‍ය වෛද්‍යවරයා සහ/හෝ හෙදිය මුණගැසෙන අවස්ථාවන්හිදී පුහුණුවලත් භාෂණ පරිවර්තකයෙකුගේ සහාය නොමිලේ ලබාගත හැකි ය. ඔබගේ පවුලේ වෛද්‍යවරයාගෙන්, හෙදියගෙන් හෝ පිළිගැනීමේ නිලධාරියාගෙන් මේ පිළිබඳව කරුණාකර අසන්න. භාෂණ පරිවර්තකයෙකු ලබාදීම සඳහා ඔවුන් විසින් ඔබට උපකාර වනු ඇත.

## අතිරේක මූලාශ්‍ර

පවුලේ වෛද්‍යවරයෙකු (GP) සමඟ සම්බන්ධවීම, නවසීලන්ත සෞඛ්‍ය හා ආබාධිත පුද්ගලයින් සඳහා වන පද්ධතිය සහ සෞඛ්‍ය සේවාවන් පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා පිවිසෙන්න:

http://www.yourlocaldoctor.co.nz
http://www.yourlocaldoctor.co.nz/useful/the-nz-health-system